# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/28 - 2018 ජනවාරි මස 16 වැනි අඟහරුවාදා - 2018.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/04/2006.

### කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2007.07.18 දිනැති හා අංක 1506/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෙම්මාතගම, පල්ලිපෝරුව, අරඹේගෙදර හි පදිංචි පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව. බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.08.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න,
අරඹේ ගෙදර,
පල්ලිපෝරුව,
හෙම්මාතගම.

නඩු අංකය - A 3218

සහ ඉල්ලුම්කරු

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

1A - G 26951 - 35 (01/2018)
*This Gazette Extraordinary can be downloaded from* www. documents.gov.lk

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධවයි

## තීන්දුව හා ප්‍රදානය

ගරු කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මැතිතුමාගේ අංක IR/2204/2006 සහ 2007.07.03 දින දරන ලිපිය මගින් 1957 අංක 14 හා 1957 අංක 62 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පහත නම් සඳහන් මා පත් කරන ලදී.

2. කම්කරු කොමසාරිස්ගේ අංක I/R/22/04/2006 හා 2007.05.17 දිනැති දරන ලිපියෙන් ඉහත කී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණා වනුයේ සීමාසහිත සබරගමුව බස් සමාගම යටතේ මාවනැල්ල ඩිපෝවට අනුයුක්තව සේවය කරමින් සිටිය දී පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතා 2004.09.01 දින සිට බලපවත්නා පරිදි VII ''ඒ'' ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස් කරමින් එම සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලැබූ 2004.08.30 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් වශයෙන් සැලකිය හැකි වන්නේ ද,

3. එය නීත්‍යානුකූල ලිපියක් වන්නේ නම් පි. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතා VII ''ඒ'' ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස්වීම හා හිඟ වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න

4. පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතාට ලැබිය යුතු අනෙකුත් සහනයන් කුමක්ද යන්න පිළිබඳවද වේ යනුවෙන් දක්වා ඇත.

5. ඉහත කී කාර්මික ආරවුලට අදාළව ප්‍රකාශ ගොනු කිරීමේ පසු බේරුම්කරණය විසින් සමථයක් ඇති කිරීම සඳහා උත්සාහ කළ ද එවැනි සමථයක් ඇති නොවූයෙන් නඩුව විභාගයට ගන්නා ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වයේ ස්ථාවරය වගඋත්තරකාර මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලද බැවින් ඉල්ලුම්කාර පාර්ශ්වයට තම නඩුව ආරම්භ කරන ලෙස බේරුම්කරණය විසින් නියම කරන ලදී. ඒ අනුව ඉල්ලුම්කාර පණ්ඩුවක්කාර ගෙදර ලක්ෂ්මන් ගුණරත්න සහ ඉල්ලුම්කාර පක්ෂය වෙනුවෙන් සීමාසහිත සබරගමුව බස් සමාගමේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. වයි. පීරිස් සහ කම්කරු නිළධාරී එස්. ඒ. ඩී. ප්‍රේමරත්න යන අයවළුන් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේ දී A1 සිට A12 දක්වා වූ ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

6. අනතුරුව වගඋත්තරකාර මණ්ඩලය විසින් තම නඩුව ආරම්භ කරමින් වගඋත්තරකාර පාර්ශ්වයේ සහකාර කළමනාකරු (පාලන) ජයසිංහ කන්කානමලාගේ චමිලා ජයසිංහ මාවනැල්ල ඩිපෝවේ මානව සම්පත් කළමනාකාර පල්ලෙගෙදර දූරයලාගේ විජේසේකර, ඩිපෝ මාර්ග පරීක්ෂක වදගම්මන පල්ලේගෙදර කරුණාරත්න පට්ටි ආරච්චිගේ ධම්මික කපිල මන්ත්‍රිම කම්කරු සබඳතා නිළධාරී සේවක මණ්ඩල කොට්ඨාසය සහකාර කළමනාකාර (මුදල්) ටී. ආර්. කපිල තෙන්නකෝන් යන අයවළුන් සාක්ෂියට කැඳවමින් ව1 සිට ව6 දක්වා වූ ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

7. ඉන් අනතුරුව බේරුම්කරණය විසින් දෙපාර්ශ්වයට නඩු විභාගයේ දී ලකුණු කළ ලේඛන සමග ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලෙසට නියම කරන ලදින් ඒ අනුව දෙපාර්ශ්වයේ ලකුණු කළ ලේඛන සහ තම ලිඛිත සැලකිරීම් බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම දෙපාර්ශ්වය අතරම මෙම බේරුම්කරණය හමුවේ පැවති ඒ 3363 දරන නඩුවේ නියෝගය හා ප්‍රදනය නිකුත් කළ වහාම මෙම නඩුවේ නියෝග හා ප්‍රදනය නිකුත් කරන බව දෙපාර්ශ්වයට දැනුම් දෙන ලදී.

8. ඒ අනුව මෙම බේරුම්කරණය විසින් විසඳිය යුතු ප්‍රශ්න වන්නේ ඉහත සඳහන් යොමුවේ දක්වා ඇති පරිදි,

කම්කරු කොමසාරිස්ගේ අංක I/R/22/04/2006 හා 2007.05.17 දිනැති දරන ලිපියෙන් ඉහත කී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ සීමාසහිත සබරගමුව බස් සමාගම යටතේ මාවනැල්ල ඩිපෝවට අනුයුත්තව සේවය කරමින් සිටිය දී පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතාට 2004.09.01 සිට බලපවත්නා පරිදි VII ''ඒ'' ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස් කරමින් එම සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් නිකුත් කරනු ලැබූ 2004.08.30 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් වශයෙන් සැලකිය හැකි වන්නේ ද,

එය නීත්‍යානුකූල ලිපියක් වන්නේ නම් පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතා VII ''ඒ'' ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස්වීම හා හිඟ වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතාට ලැබිය යුතු අනෙකුත් සහනයන් කුමක්ද යන්නය.

9. සාක්ෂි විග්‍රහය

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති 2005.01.25 දින දරන පළමු ප්‍රකාශය මගින් ඉල්ලුම්කරු එවකට සේවය කළ සීමාසහිත සබරගමුව බස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. වයි. පීරිස් මහතා විසින් නිකුත් කළ සහ මෙම නඩුවේ දී ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කළ A1 දරන උසස් කිරීමේ ලිපිය අනුව 2004.09.01 දින සිට බලපවත්වන පරිදි ඉල්ලුම්කාර

පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතා වගඋත්තරකාර සමාගමේ viiA වන ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට පත්කරන ලද බවත් ඉන්පසු එම තනතුරට අදාළ ගෙවීම් කරන ලෙසට කළමනාකාර (මුදල්) අතිකුත් අධ්‍යක්ෂකවරුන් වෙතද මුදල්/ධාවන/ඉංජිනේරු යන තනතුරුවලට දැනුම් දීම් කර ඇති බවටත් 2004.09.01 දින සිට ඩිපෝ මාර්ග පරීක්ෂකවරයෙකු වශයෙන් කාර්යාලයේ සේවය කළ බවත් පසුව 2004.10.04 වන දින පස්වරු 7.20 ට පමණ තමන්ට සේවා ස්ථානයේදී වගඋත්තරකාර සමාගමේ සමන් විජේවීර, පී. ඩී. විජේසේකර. ඒ. එම්. පී. අයි. වීරවර්ධන සහ සුභසිංහ යන අය විසින් පහරදීම් සිදුකල බවත් පසුව සේවක මණ්ඩල කළමනාකාර තැනගේ 2004.11.12 දරන ලිපියෙන් එකී උසස්වීම අවලංගු කර ඇති බවත් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වන බැවින් ඔහු විසින් මෙම උසස්කිරීම ලබාදුන් බවත් ඔහු යටතේ සේවය කළ පහල නිලධාරියෙකු හා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කරනු ලබන සේවක මණ්ඩල කළමනාකාර තැනට මෙම පත්වීම අවලංගු කළ නොහැකි බවත් එමගින් ඉල්ලුම්කරුට සිදුවී ඇති අසාධාරණය ඉවත් කර සාධාරණත්වය ඉටු කරන ලෙසත් අයැද ඇත.

10. එහෙත් වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කර ඇති දිනයක් රහිත පළමු ප්‍රකාශය මගින් ඉහත කී ඉල්ලුම්කරුගේ ස්ථාවරය නොපිළිගනිමින් 2004.11.12 දින සීමාසහිත සබරගමු බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකරු විසින් ඉහත කී උසස්වීම අවලංගු කර ඇති බවත් ඉල්ලුම්කරු උසස් කරන ලද ලිපිය නීත්‍යානුකූල ලිපියක් නොවන බවත් එසේ හෙයින් මෙම ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුතු බවත් දක්වා ඇත.

11. මේ අනුව ලකුණු කළ ලේඛණත් දෙපාර්ශවයේ වාචික සාක්ෂිත් දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශණත් සමස්ථයක් වශයෙන් සලකා බැලීමේදී යෙමුවේ දක්වා ඇති පරිදි ප්‍රශ්ණගත ලේඛනය එනම් සී/ස සබරගමු බස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2004.08.30 දාතමින් නිකුත් කර ඇති 2004.09.01 දින සිට බලපවත්වන පරිදි ඉල්ලුම්කාර පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතා viiA ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට උසස් කරමින් එකී කළමනාකාර අධ්‍යක්ෂ විසින් නිකුත් කර ඇති 2004.08.30 දිනැති ලිපිය නීත්‍යානුකූල ලිපියක් වශයේ සැලකිය හැකි බවටත් එකී උසස්වීම සහ ඊට අදාළ හිඟ වැටුප් මෙහි ඉල්ලුම්කාර පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මහතාට හිමි බවටත් බේරුම්කාර මම මෙයින් තීරණය කරමි.

12. *මා එසේ තීරණය කිරීමට හේතු වූ කරුණු නම් :*

1 26 දරන ලේඛනය නිකුත් කළ ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු එකී ව6 දරන ලේඛනය සම්බන්ධයෙන් සාක්ෂි දීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කැඳවීමට අපොහොසත් වීම.

2 ඉහත කී කළමනාකාර අධ්‍යක්ෂක සහ එස්. ආර්. වයි. පීරිස් මහතා තම සාක්ෂියේදී එකී ව6 දරන ලේඛනය තමුන්ට නොලැබුණු බව ප්‍රකාශ කිරීම.

3 ඉල්ලුම්කරු විසින් ඉහත A1 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය ඉහත කී කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. වයි. පීරිස් මහතා තම සාක්ෂියේදී එකී A1 දරන ලේඛනය තම සමාගමෙන් නීත්‍යානුකූල නිකුත් කර ඇති ලිපියක් බව ප්‍රකාශ කර තිබීම.

4 වගඋත්තරකාර පාර්ශවය ව7 ලෙස ලකුණු කර ඇති viiA ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට අවලංගු කරමින් ( එනම් A1 දරන ලිපිය) අවලංගු කිරීමට කළමනාකාර අධ්‍යක්ෂ යටතේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කර ඇති සේවක මණ්ඩල කළමනාකාර තැනට බලයක් ඇති බවට මෙම බේරුම්කරණය සෑහීමට පත්වන පරිදි ලේඛනගත සාක්ෂි මගින් තහවුරු කිරීමට වගඋත්තරකාර පාර්ශවය අපොහොසත් වීම.

5 ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කර ඇති A2 සහ A3 දරන ලේඛන සීමාසහිත සබරගමු බස් සමාගමේ කලින් සිටි කළමනාකාර අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කර තිබීම සහ මෙම A1 දරන ලිපිය පමණක් නොපිළිගැනීමට සාධාරණ හේතුවක් දැක්වීමට වගඋත්තරකාර පක්ෂය අපොහොසත් වීම.

6 ඉහත කරුණු සනාථ කරමින් A1 දරන ලිපිය නිකුත් කළ සීමාසහිත සබරගමු බස් සමාගමේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ එස්. ආර්. වයි. පීරිස් මහතා පහත අයුරින් සාක්ෂි දී තිබීම.

ඔහු තම සාක්ෂියේදී මෙසේ ප්‍රකාශකර ඇත.

ප්‍ර තමුන්ගේ තනතුර කුමක්ද ?
උ සීමාසහිත සබරගමු බස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ

ප්‍ර ඒ තනතුර ඔබට පිරිනමා තිබුණේ කුමන ආකාරයටද ?
උ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිරිනමන ලද තනතුරක්

ප්‍ර මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිරිනමන ලද තනතුර එම තනතරේ ඔබ කිනම් කාලයක් සේවය කළාද?
උ 2005.10.19 මා එම තනතුරෙන් ඉවත් වුණා.

ප්‍ර මෙම කාලය තුළ සීමාසහිත සබරගමු බස් සමාගමේ වක්‍ර ප්‍රධාන නිලධාරියා කියා කීවා නේද?
උ ඔව් ප්‍රධාන විධායක නිලධාරියා

ප්‍ර මහත්මයා සී/ස සබරගමු බස් සමාගමේ කළමනාකරු ලෙස පත්වුනේ කවදාද?
උ 2004.07 වෙනි මස 7 හෝ ආසන්න දිනක

ප්‍ර කවුද ඔබව එම තනතුරට පත් කළේ?
උ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා

ප්‍ර තමන් ආයතනයේ විධායක අධ්‍යක්ෂකද කළමනාකාර අධ්‍යක්ෂද?
උ කළමනාකාර අධ්‍යක්ෂ

අධිකරණය

ප්‍ර A1 ලේඛනය පෙන්වා සිටී. A1 තමන්ගේ ලේඛනයක් ලෙස පිළිගන්නවාද?
උ ඔව්

ප්‍ර එම ලිපියෙන් කුමක්ද ලැබෙන්නේ?
උ ඩිපෝ මාර්ග පරීක්ෂක

ප්‍ර එම ලිපිය සේවක මණ්ඩල කළමනාකරුට අවලංගු කළ හැකිද?
උ බැහැ

ප්‍ර තමන් කියා සිටියා පත්වීම් උසස්වීම් වල බලධාරියා තමන් කියා?
උ ඔව්

ප්‍ර තමන් සීමාසහිත බස් සමාගමේ කොපමණ කාලයක් වැඩ කළාද?
උ මාස 04 ක් පමණ

ප්‍ර තමුන්ට ඉහළ නිළධාරියෙක් සිටියාද?
උ නැහැ

ප්‍ර ආයතනයට බඳවා ගැනීම් තනතුරුදීම් සිදුවන්නේ කළමනාකාර අධ්‍යක්ෂක යටතේද?
උ ඔව් අධීක්ෂණය යටතේ
(A1 ලේඛනය සාක්ෂිකරුට පෙන්වයි)

ප්‍ර මෙම ලිපිය ඔබතුමන් විසින් නිකුත් කරන ලද ලිපියක්ද?
උ ඔව් මගේ අත්සන යටතේ නිකුත් කර තිබෙන්නේ

ප්‍ර මෙහි තිබෙන අත්සන ඔබගේ අත්සනද?
උ ඔව්

ප්‍ර තනතුර දීමේ උසස්වීම් දීමේ අයිතිය ඔබට පැවරී තිබෙනවාද?
උ ඔව්

ප්‍ර සීමාසහිත සබරගමු බස් සමාගමේ ඔබ විසින් පිරිනමන ලද තනතුරක් ඔබට හරි වෙනත් අයෙකුට හරි අවලංගු කිරීමට බලයක් තිබෙනවාද?
උ නැත

ඉහත කී එස්. ආර්. වයි. පීරිස් මහතා වගඋත්තරකාර පාර්ශවයේ හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර තමන් මූලික සාක්ෂියේදී කියා සිටියේ 2004.07.30 දින සිට 2005.10.19 දක්වා සේවය කළ බවද?
උ ඔව්

සාක්ෂිකරුගේ මූලික සාක්ෂි පරස්පර විරෝධි අන්දමින් සාක්ෂි දෙන බව නීතිඥ මහතා ප්‍රකාශ කර සිටී.

උ මා එය පිළිගන්නේ නැහැ. ඒ ලිපියේ හැටියට එකල සිටි ජනාධිපතිනිය ඒ කාලයේ අපව අරලියගහ මන්දිරයට ගෙන්වා මෙම පත්වීම අවලංගු කරන්නේ නැහැ කියා කීවා.

ප්‍ර A1 ලිපිය A4 මගින් අවලංගු කළ හැකිද?
උ බැහැ

ප්‍ර A1 දරන ලිපිය නිකුත් කළ බවට ප්‍රකාශ කළේ?
උ ඔව්

ප්‍ර තමන්ට මතකද සීමාසහිත සබරගමු බස් සමාගම විසින් නිකුත් කර ඇති 2005-09-05 දරන ලිපිය?
උ සාක්ෂිකරු එම ලිපිය පිළි නොගනී

ප්‍ර තමන් ප්‍රධාන විධායක නිලධාරි හැටියට අධ්‍යක්ෂ මණ්ඩලය කොයිවේලාවකවත් රැස් කළාද?
උ එසේ කළේ නැහැ

ප්‍ර යම් යම් පත්වීම් වලට අනුමැතිය ගත් බවට සඳහන් වන්නේ කොහේද?
උ එසේ අනුමැතියක් අවශ්‍ය නැහැ

ප්‍ර තමන් තනියම තීරණ ගත්තාද?
උ නැහැ අධ්‍යක්ෂවරු හිටියා

ප්‍ර ඕනෑම පත්වීමක් ඔබට දීමට හැකිද?
උ සාධාරණ පත්වීමක් දිය හැකියි

ප්‍ර තමා පිළිගන්නවාද තමාට වඩා ඉහළ නිලධාරියෙක් සිටිය නැති බව?
උ ඔව්

7 මෙම කරුණ සම්බන්ධයෙන්ම කොළඹ කම්කරු මහා ලේකම් කාර්යාලයේ 7 වන මහලේ කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු කොමසාරිස් ඩී. එම්. එස්. දිසානායක මහතා විසින් ඉහත කී A1 දරන ලේඛනය පිළිගත හැකි ලියවිල්ලක් බවත්, ඒ අනුව ඉල්ලුම්කරු සේවයේ පිහිටුවා අදාළ හිඟ වැටුප් ගෙවන ලෙස ඔහුගේ 2007.01.04 දින දරන ලිපියෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කර තිබීම. (මෙම ලිපිය A5 ලෙස ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කර ඇත.

8 ඉහත කී ලක්ෂමන් ගුණරත්න මහතා ඉහත කී A1 දරන ලිපියෙන් ලැබුණු උසස්වීම මත viiA ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක වශයෙන් 2004.09.01 දින සිට උසස් කර ඇති අතර ඒ අනුව එකී තනතුරට හිමි රාජකාරිද 2004.11.12 දක්වා ඉටුකර ඇති අතර, ඔහුට 2004.11.12 දිනෙන් පසුව එකී තනතුරේ සේවය කිරීමට වාර්තා කිරීමට ඉඩ නොලැබීම.

13. මේ අනුව ඉහත කී A1 දරන ලිපියෙන් උසස් කර ඇති පී. ජී. ලක්ෂමන් ගුණරත්න මහතාව viiA ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරේ පිහිටුවා ඊට අදාළ වැටුප් ක්‍රමයේ එකී ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුරට හිමි හිඟ වැටුප් 2008.10.05 දින දක්වා (එනම් එකී බස් සමාගමේ සේවයට වාර්තා කළ අවසාන දිනය 2008.10.05 දක්වා) ගෙවන ලෙසට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි.

14. ඉහත කී නියෝගය හා ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවීමෙන් පසු එක් මසක් ඇතුළත අදාළ හිඟ වැටුප් ඉල්ලුම්කරුට පසුව ලබාගත හැකිවන පරිදි කෑගල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මෙයින් වැඩිදුරටත් නියෝග කරමි.

15. මෙය සාධාරණ හා යුක්ති සහගත නියෝගයක් හා ප්‍රදානයක් කොට මම සලකමි.

**පී. දනන්සූරිය,**
බේරුම්කරු.
වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 04 වැනි දින.
කොළඹ දී ය.

02-67

*මගේ අංකය* : IR/10/14/2009.

**කාර්මික ආරවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.09.01 දිනැති හා අංක 1878/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.08.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කටුගස්තොට, රණවන, අංක 287 හි පදිංචි මියගිය ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මයා වෙනුවෙන් ආර්. එම්. පොඩිමැණිකේ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව. බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.09.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

*යොමු අංකය* : IR/10/14/2009.

2018 ජනවාරි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණයේ දී ය

එක් පාර්ශවයක් වශයෙන්
මියගිය ඩී. පී. ඩී. වික්‍රමආරච්චි
වෙනුවෙන් ආර්. එම්. පොඩිමැණිකේ මිය
අංක. 287,
රණවන,
කටුගස්තොට.

නඩු අංකය - A 3580

සහ

අනෙක් පාර්ශවය වශයෙන්
ලංකා විදුලිබල මණ්ඩලය
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

**ප්‍රදානය**

වර්ෂ 1957 අංක 14 සහ 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1965 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2014.08.19 දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශවය අතර පවතින ආරවුල මෙසේය.

ලංකා විදුලිබල මණ්ඩලයේ රියදුරෙකු වශයෙන් සේවය කර 2003.12.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා විදුලිබල මණ්ඩලීය විශ්‍රාම වැටුප් අරමුදල ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන්නේද යන්න හා නොඑසේ නම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

දෙපාර්ශවය සිය ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව මෙම නඩුවේ ඉල්ලුම්කරු මිය යාම හේතුකොටගෙන ඔහුගේ බිරිඳ ආදේශක ඉල්ලුම්කාරිය ලෙස පළමු පාර්ශවයේ එකඟතාවය මත පත් කරන ලදී. මෙම ආරවුල සම්බන්ධයෙන් මීට පෙර A 3393 යටතේ යොමු කිරීමක් සිදුකර තිබූ අතර, එලෙස පත් කරන ලද බේරුම්කරු ඉල්ලා අස්වීම හේතුකොට ගෙන නැවත මෙම යොමු කිරීම මා වෙත සිදුකර ඇත.

අංක A3393 යටතේ මෙම නඩුව ආරම්භ කර ඉල්ලුම්කරු සාක්ෂියට කැඳවා තිබූ අතර, ඔහුගේ මූලික සාක්ෂිය නිම කිරීමෙන් පසුව හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කර ඇති අතර, එම සාක්ෂිය නිම කිරීමට පෙර ඉහත බේරුම්කරු ඉල්ලා අස් වී ඇත.

ඉල්ලුම්කරු A 3393 යටතේ ඉදිරිපත් කළ සාක්ෂිය අවසන් කර නැතත් ඉදිරිපත් කරන ලද සාක්ෂිය පිළිගැනීමට දෙවන පාර්ශවය මා ඉදිරියේදී එකඟ විය.

ඉහත සාක්ෂියෙන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශවය කිසිදු සාක්ෂිකරුවෙකු නොකැඳවා නඩුව අවසන් කර ඇත. වගඋත්තරකාර පාර්ශවය හෙවත් දෙවන පාර්ශවය සිය නඩුව ආරම්භ කරමින් මානව සම්පත් කළමනාකරු ඒ. ආර්. එන්. කේ. සුමනසේකර මහතා සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව දෙවන පාර්ශවය සිය සාක්ෂිය මෙහෙයවීම අවසන් කරන ලදී.

ඉල්ලුම්කාර පාර්ශවය ලකුණු කරන ලද A1 සිට A27 දක්වා ලේඛන සමග ලිඛිත සැලකිරීම් බේරුම්කරණයට භාරදෙන ලදී. වගඋත්තරකරු හෙවත් දෙවන පාර්ශවය R1 සිට R18 දක්වා ලේඛන සමග ලිඛිත සැලකිරීම් ප්‍රමාද වී භාරදෙන ලදී.

ඉහත ඉල්ලුම්කරු වෑන් රථ රියැදුරෙකු වශයෙන් 1979.04.26 දින සේවයට පත්ව තිබූ බවද ඉන් අනතුරුව ලොරි රථ රියැදුරෙකු ලෙස 1981.06.01 දින සිට පත්ව තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය.

ඉහත පරිදි ඉල්ලුම්කරු සේවය කරමින් සිටියදී 1997.07.16 සිදු කරන ලද විෂමාචාර ක්‍රියාවක් මත සේවය තහනම් කර ඇති අතර, අදළ ලිපිය A3 ලෙසත් එකී ලිපිය 1997.12.25 දිනයෙන් යුතුව නිකුත් කර ඇත. ඉන් අනතුරුව ඉල්ලුම්කරුට චෝදනා තුනකින් යුක්ත චෝදනා පත්‍රයක් ලබාදී විනය පරීක්ෂණයක් පවත්වා ඉල්ලුම්කරුගේ සේවය අවසන් කර ඇත. එලෙස අවසන් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරු මහනුවර කම්කරු විනිශ්චය සභාවට අංක 12/05/99 යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරමින් නඩුවක් පවරා ඇත. ඉහත නඩුව විභාගකිරීමෙන් අනතුරුව ඉල්ලුම්කරුට සේවය නොමැති කාලයට හිඟ වැටුප් රහිතව සේවය කඩවීමකින් තොරව සේවයේ පිහිටුවීමට තීන්දුවක් ලබා දී ඇත.

ඉහත තීරණයට විරුද්ධව ඉල්ලුම්කරු මහාධිකරණයට අභියාචනයක් කර නැත. ඉහත නියෝගයෙන් පසුව වගඋත්තරකරු 2003.07.10 දින සිට සේවය කඩවීමකින් තොරව නැවත සේවයේ පිහිටුවා ඇත. ඉහත කරුණු දෙපාර්ශවයම බේරුම්කරණයට ඉදිරිපත් කළ සාක්ෂි අනුව තහවුරු විය.

ඉහත පරිදි සේවයේ පිහිටුවීමෙන් අනතුරුව ඉල්ලුම්කරුව 2003.12.04 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බව වගඋත්තරකාර පාර්ශවය නිකුත් කරන ලද A8 වශයෙන් ඉල්ලුම්කාර පාර්ශවයට ඉදිරිපත් කරන ලද ලේඛනය අනුව තහවුරු විය. වගඋත්තරකරු මෙම කරුණු ප්‍රතික්ෂේප කොට නැත. ඉහත ඉදිරිපත් වූ සාක්ෂි අනුව කම්කරු විනිශ්චය සභා නියෝගය පරිදි 2003.07.10 දින සිට ඉල්ලුම්කරුව සේවයේ පිහිටුවීමෙන් අනතුරුව, 2003.12.04 වන දින සිට විශ්‍රාම ගන්වා තිබෙන බව දෙපාර්ශවයම ඉදිරිපත් කළ සාක්ෂි අනුව තහවුරු වේ.

ඉල්ලුම්කරුගේ උපන් දිනය 1944.08.20 බව A1 උප්පැන්න සහතිකය හා වගඋත්තරකරු ඉදිරිපත් කළ සාක්ෂි අනුව ද තහවුරු විය.

ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපිය වගඋත්තරකරු R1 වශයෙන් ලකුණු කොට තිබූ අතර, එම ලිපිය පරිදි අවුරුදු 55 න් විශ්‍රාම ගන්වන බව එකී ලිපියේ 10 ඡේදයේ දක්වේ. ඉල්ලුම්කරු ඉදිරිපත් කළ සාක්ෂියේ දී වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකි බව ද, අවුරුදු 55 න් පසුව සේවය වාර්ෂිකව දීර්ඝකිරීම් මත වයස අවුරුදු 60 දක්වා සේවය කළ හැකිව තිබෙන බවද බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

මෙම ඉල්ලුම්කරු කම්කරු විනිශ්චය සභා නියෝගයෙන් පසුව සේවයට වාර්තාකර ඇති අතර, එලෙස වාර්තාකිරීමෙන් අනතුරුව සේවය දීර්ඝකිරීමක් ඉල්ලා තිබූ බව වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට ලබාදෙන ලද A19 ලේඛනය අනුව අනාවරණය වේ.

කම්කරු විනිශ්චය සභා නියෝගය ලබාදී ඇත්තේ එම විනිශ්චය සභාවට ඉදිරිපත් වූ සියලුම සාක්ෂි පදනම් කරගෙනය. ඉන් අනතුරුව සේවයේ පිහිටුවන විට ඔහුගේ වයස අවුරුදු 58 ක් ඉක්මවා තිබූ බව පිළිගත හැකිය. වගඋත්තරකරු ඉල්ලුම්කරුගේ සේවා දීර්ඝය ලබානොදී මාස තුනක කාලයක් දැනුම් දීමෙන් අනතුරුව 2003.12.04 දින සිට විශ්‍රාමගන්වා ඇති බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉල්ලුම්කරුට කම්කරු විනිශ්චය සභා නියෝගය පරිදි 2003.07.10 දින සිට සේවය ලබාදී 2003.12.04 දින සිට ඉල්ලුම්කරුව විශ්‍රාම ගන්වා තිබෙන බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු වේ.

ඉල්ලුම්කරු ඉල්ලන ලද සේවා දීර්ඝය ලබාදීම තුළින් ඉල්ලුම්කරුට විශ්‍රාම වැටුප හිමි නොවන හෙයින් මෙලෙස මාස තුනකින් විශ්‍රාම ගැන්වීමට තීරණයකර තිබෙන බව 2003.09.15 දින දරණ A19 ලේඛනය අනුව අනාවරණය වේ. ඉල්ලුම්කරුගේ සේවය A3 ලේඛනය මගින් 1997.12.25 දින සිට තහනම් කොට ඉන් අනතුරුව පැවැති විනය පරීක්ෂණයේ දී ඉල්ලුම්කරුට නගන ලද චෝදනාවලට වැරදිකරු වීම මත ඉල්ලුම්කරුගේ සේවය වගඋත්තරකරු අවසන් කර ඇත. ඉන් අනතුරුව ඉල්ලුම්කරු කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විභාගයක් පැවැත්වීමෙන් අනතුරුව ලැබුණු නියෝගය පරිදි සේවය කඩවීමකින් තොරව සේවය ඉල්ලුම්කරුට ලබාදී ඇත. ඉහත නියෝගය පරිදි ඉල්ලුම්කරුව සේවයේ පිහිටුවා ඇත්තේ 2003.07.10 දින බව සනාථ විය. ඉහත පරිදි සේවයේ පිහිටුවීමෙන් අනතුරුව අවුරුදු 60 දක්වා සේවය කිරීමට හැකියාවක් තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඉල්ලුම්කරුට කම්කරු විනිශ්චය සභාවෙන් ඉහත නියෝගය ලබාදී ඇත්තේ ඉල්ලුම්කරුගේ පෙර වැරදි සලකා බැලීමෙන් අනතුරුව බව ද පිළිගත හැකිය. නැවත සේවයෙහි 2003.07.10 දින සිට පිහිටුවීමෙන් අනතුරුව ඉල්ලුම්කරු විෂමතා සිදුකර තිබූ බව තහවුරු නොවුනි. ඉහත සාක්ෂි අනුව අවුරුදු 60 ක් දක්වා සේවය කිරීමට සේවා යෝජක ඉඩ ලබා දී නැති බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුට සේවය නොමැතිව සිටි කාලයට වැටුප් ලබානොදීමට කම්කරු විනිශ්චය සභාව තීරණයකර ඇත. ඉදිරිපත් වූ සාක්ෂි සේවා දීර්ඝය ලබා නොදීමට එය හේතු නොවන බව ද පිළිගත හැකිය.

ඉහත මණ්ඩලයේ විශ්‍රාමික වැටුපකට හිමිකමක් තිබෙන බවද, ඒ අනුව සේවකයෙකු අවම වශයෙන් මාස 240 ක් සේවය කළ යුතු බව ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී පිළිගෙන ඇත. විශ්‍රාම වැටුපට අදාළ කොන්දේසි ඇතුළත් අංක 1321/18 හා 2003.12.31 දින දරන ගැසට් පත්‍රය A25 ලෙස ලකුණු කොට ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට ඉදිරිපත්කර තිබිණ. එම ලේඛනයේ 22.1 යටතේ මාස 240 ක් සම්පූර්ණ කිරීම මත විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙන බව සඳහන්ව ඇති අතර මාස 240 කාලයට සේවක අර්ථ සාධක ගෙවීම මත පදනම්ව මෙම විශ්‍රාම වැටුපට හිමිකම ලැබෙනු ඇත.

කම්කරු විනිශ්චය සභා නියෝගය පරිදි ඉල්ලුම්කරුව සේවය කඩවීමකින් තොරව සේවයේ පිහිටුවා ඇතත් සේවය නොමැති කාලයට වැටුප් අහිමිකර ඇත.එය දඬුවමක් වනු ඇත. ඉහත පරිදි වැටුප් අහිමිකිරීමෙන් ඉල්ලුම්කරුට විශ්‍රාම හිමිකම ලබාගැනීමට නොහැකිවී ඇත. ඉල්ලුම්කාර පාර්ශවය බේරුම්කරණයට කරුණු ඉදිරිපත් කරමින් සේවය නොමැතිව සිටි කාලයට සේවා පාරිතෝෂිකය ලැබී තිබෙන බවත් ඒ අනුව විශ්‍රාම වැටුපට ද හිමිකම් තිබෙන බවට කරුණු ඉදිරිපත් කර තිබිණ. කම්කරු විනිශ්චය සභා නියෝගය පරිදි සේවය අඛණ්ඩ ලෙස සැලකීම මත සේවා පාරිතෝෂික ගෙවූ බවද ඉල්ලුම්කරුට අදළ කාලය තුළ වැටුප් නොගෙවීම මත සේ. අ. අ. අරමුදලට මුදල් බැර කර නොතිබූ බවට වගඋත්තරකරු ඉදිරිපත් කළ කරුණු ඉල්ලුම්කාර පාර්ශවය බිඳ හෙලා නොතිබුණි. ඒ අනුව ඉල්ලුම්කරුට මාස 240 ක කාලයක් සඳහා සේ. අ. අ. ගෙවා නොතිබූ බව බේරුම්කරුට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.එසේම ඉල්ලුම්කරු විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව සේවා පාරිතෝෂකයද ලබාගෙන තිබූ බව තහවුරු විය. විශ්‍රාම ගන්වනු ලබන සේවකයින්ට විශ්‍රාම පාරිතෝෂිකය ගෙවන බවද මෙම ඉල්ලුම්කරු ඊට සුදුසුකම් නොලැබීම මත සේවා පාරිතෝෂිකය ගෙවා තිබූ බව වගඋත්තරකරු සඳහන් කර තිබිණ. කම්කරු විනිශ්චය සභාව ලබාදුන් නියෝගය පරිදි සේවායෝජක කටයුතු කර තිබූ බව ද පිළිගත හැකි ය.

කම්කරු විනිශ්චය සභාවෙන් දෙන ලද නියෝගය අභියෝගයට ලක් කළ යුත්තේ මහාධිකරණය මගින් වන අතර, මෙලෙස ලබාදුන් නියෝගයකට බේරුම්කරණයට මැදිහත් විය නොහැකිය.

මාසයකට දින 22 ක කාලයක්, මාසයක් වශයෙන් ගණනය කළ හැකි බවද , ඒ අනුව ඉල්ලුම්කරු මාස 240 කට වඩා සම්පූර්ණ කර ඇති බවට ඉල්ලුම්කරු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර තිබුණි.

දින 22ක් සේවය කළහොත් මාසයක් ලෙස සැලකිය හැකි බවද A25 ලේඛනයේ 22:12 යටතේ එය දැක්වෙන බවට ඉල්ලුම්කරු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර තිබිණ. වගඋත්තරකාර පාර්ශවයේ කැඳවන ලද සාක්ෂිකරු ප්‍රකාශකර සිටියේ දෛනික සේවකයින් සඳහා දින පදනම් කොට ගණනය කළ බවය. ඉල්ලුම්කරුව සේවයට බඳවාගෙන ඇත්තේ ස්ථිර සේවකයෙකු ලෙස හෙයින් එය අදළ නොවන බව ද ඉහත සාක්ෂිකරු සඳහන්කර තිබිණ.

මුළු සේවා කාලය පදනම් කර දින 22 ක් මාසයක් ලෙස ගණනය කළහොත් සේවය කරන ලද වැටුප් ලැබෙන මාස ගණන ඉක්මවන බව ද පිළිගත හැකි කරුණකි. ඒ අනුව එකී පදනම නිවැරදි නොවන බවද පිළිගත හැකිය. සේවක අර්ථසාධක බැර කිරීම් මාස් පතා සිදුවන හෙයින් දින 22 ක පදනම් මුළු සේවා කාලය බෙදීමෙන් ගණනය කිරීම නිවැරදි නොවන බවද පිළිගත හැකිය. 22:12 වගන්තිය පරිදි දෛනික සේවකයින්ට දෛනික වැටුප පදනම් කොට විශ්‍රාම වැටුප් දයකත්වය ලබාදීම සඳහා ඉහත පරිදි කටයුතුකර තිබෙන බවට වගඋත්තරකරු ඉදිරිපත් කළ සාක්ෂිය නිවැරදි බව ඉහත ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

ඉල්ලුම්කරුට මාස 240 ක කාලයක් සඳහා සේවක අර්ථසාධක බැරනොවීම මත විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප අහිමි වී ඇති බවත් එය විශ්‍රාම වැටුප් ලබාදීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත හා චක්‍රලේඛ පරිදි සිදුව ඇති බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය. ඒ අනුව ඉල්ලුම්කරුට විශ්‍රාම වැටුප ලබාගැනීමට හිමිකමක් නොමැති බව ඉදිරිපත් වූ සියලුම සාක්ෂි මගින් තහවුරුව ඇති බව මම නිගමනය කරමි.

බේරුම්කරණයට යොමු කරන ලද යොමුව මෙසේය :

ලංකා විදුලිබල මණ්ඩලයේ රියැදුරෙකු වශයෙන් සේවයකර 2003.12.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ ඩී. පී. ඩී. වික්‍රමආරච්චි මහතා විදුලිබල මණ්ඩලීය විශ්‍රාම වැටුප් අරමුදල ප්‍රකාරව විශ්‍රාම වැටුපක් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා නොඑසේ නම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

වගඋත්තරකාර මණ්ඩලයේ විශ්‍රාම වැටුපට අදාළව පනවා ඇති රෙගුලාසි සම්පූර්ණ කර නොතිබීම මත ඉල්ලුම්කරුට විශ්‍රාම වැටුප අහිමි වී ඇති බව ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු විය. විශ්‍රාම ලබාගැනීමට නොහැකිවීම මත අවසන් සේවා දිගුව ලබා නොදීම අසාධාරණ හා අයුක්තිසහගත බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

විශ්‍රාම වැටුපට හිමිකම් ලබන්නේද යන්න හා නොඑසේ නම් ඔහුට හිමිවිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න ඉහත යොමුවේ සඳහන්ව ඇත.

කම්කරු විනිශ්චය සභා නියෝගය පරිදි ඉල්ලුම්කරුව 2003.07.10 දින සිට සේවයේ පිහිටුවා ඇත. ඉල්ලුම්කරුගේ උපන්දිනය පරිදි 2003.08.20 එනම් ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 59 සම්පූර්ණ වේ. ඉල්ලුම්කරුගේ වයස නොසලකා A19 ලිපිය පරිදි මාස තුනක කල්දීමකින් 2003.12.04 අග සිට සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත. සේවා දීර්ඝයක් ඉල්ලා තිබියදී කම්කරු විනිශ්චයසභා නියෝගය පරිදි සේවයෙහි පිහිටුවා වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට ඉඩ ලබානොදීම අසාධාරණ හා අයුක්තිසහගත බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව මම නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුට අවුරුදු 60 දක්වා හිමි වැටුප ප්‍රදානයක් වශයෙන් ගෙවීම සාධාරණ හා යුක්තිසහගත බව මම නිගමනය කරමි.

ඉල්ලුම්කරුගේ වැටුප් ලේඛනය වන A22 පරිදි මාසික වැටුප රු. 14,955/- කි. ඉල්ලුම්කරුට අවුරුදු 60 දක්වා සේවය කිරීමට මාස 8 දින 16 ක් තිබෙන බව R17 ලේඛනය අනුව පිළිගත හැකිය. ඉහත විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව ඉල්ලුම්කරු කම්කරු විනිශ්චය සභාවට හෝ වෙනත් නීතිමය ආයතනයකින්ද සහනයක් ලබාගෙන තිබූ බව තහවුරු නොවුනි. ඒ අනුව ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 60 දක්වා සේවා කාලයට හිමි වැටුප ගෙවීම සාධාරණ හා යුක්තිසහගත බව මම නිගමනය කරමි.

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ මාසික වැටුප | රු. 14,955 x 8 | = 119,640/- |
| දින 16 ක වැටුප | | = 7,976/- |
| | | = 127,616/- |

ඉහත කාලයට හිමි වැටුප රු. 1,27,616/- ක මුදල ආදේශිත ඉල්ලුම්කාරියට ගෙවන ලෙසත්, මෙකී ප්‍රදානය *ගැසට්* පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව මාස තුනක කාලයක් තුළදී සහකාර කම්කරු කොමසාරිස් දකුණු කොළඹ වෙත තැන්පත් කරන ලෙසත් එසේ තැන්පත් කිරීමෙන් අනතුරුව එකී ආදේශිත ඉල්ලුම්කාරියට ගෙවන ලෙසත් ඉහත වගඋත්තරකරුට නියම කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත්කරමි.

**පාලිත වීරසේකර,**
බේරුම්කරු.

දිනය : 2017.09.11

02-68

---

***මගේ අංක* : IR/15/25/2011.**

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.03.11 දිනැති හා අංක 1853/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.02.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොරටුව, කටුබැද්ද, අල්විස් පෙරේරා මාවත, අංක 58 හි පදිංචි ජී. ඒ. සමික අසිතංජ මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 09, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 609 හි පිහිටි ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.11.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ජී. ඒ. සමික අසිතංජ මහතා,
අංක 58, අල්විස් පෙරේරා මාවත,
කටුබැද්ද,
මොරටුව.

නඩු අංකය : A 3538

සහ

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව,
අංක 609, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය වන ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම පිණිස කරන ලද පත් කිරීම 2014.02.18 වන දින දරන ලිපිය මගින් මා වෙත යොමු කර ඇත.

එකී යොමු කිරීම අනුව පාර්ශවකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇති කරුණ වනුයේ ;

''ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවේ බී - 1 ශ්‍රේණියේ ලිපිකරුවෙකු ලෙස සේවය කරන ජී. ඒ. සමික අසිතංජ මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය මගින් පනවන ලද දඬුවම් හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවූයේද යන්න හා එලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳ වේ.''

දෙපාර්ශවය විසින් ඔවුන්ගේ ප්‍රකාශ හුවමාරු කර ගැනීමෙන් පසු 2014.07.11 දින ඉල්ලුම්කරු වෙනුවෙන් කේ. එච්. එස්. අබේරත්න මහතා පෙනී සිටි අතර, විත්තිකාර ආයතනය වෙනුවෙන් නීති නිලධාරී සුභාෂිනි දිසානායක මහත්මිය සමග ප්‍රියන්ත වැලිකල මහතා මානව සම්පත් අංශයේ විධායක සහකාර ලෙස පැමිණි සිටියදී දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ද සාක්ෂි ලිඛිත දේශන හා ලේඛන විශ්ලේෂණය කිරීමෙන් පසු අවසාන තීන්දුවක් දීමට ආසන්නව තිබියදී ඉල්ලුම්කරු විසින් පහත ඉල්ලීම කරන ලදී.

'' ඉල්ලුම්කරු සංස්ථාවේ සභාපතිතුමා වෙත කරන ලද අභියාචනයේ ප්‍රතිඵලයක් ලෙස මෙම නඩුව සමථයකට පත් කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ කළමනාකාරීත්වයට එකී අභියාචනය අනුව ඉල්ලුම්කරුට නඩුව ඉල්ලා අස්කරගන්නා ලෙසය. ඉල්ලුම්කාර පාර්ශ්වය කියා සිටින්නේ ඉල්ලා ඇති සහන ලැබෙනවා නම් නඩුව ඉල්ලා අස්කර ගැනීමට සූදානම් බවයි.''

ඉල්ලුම්කරුගේ පහත කොන්දේසිවලට වගඋත්තරකාර පාර්ශවය එකඟවීම නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම මත නඩුව ඉල්ලා අස්කර ගැනීමට ඉඩ දෙන ලදී. එම කොන්දේසි පහත අයුරින් වේ.

අ. හිඟ වැටුප් දීමනා, වන්දි රහිතව නැවත A vii වන ශ්‍රේණියට පත් කිරීම.
(මෙය පෙර දාතම කිරීමක් නොවෙයි. ඒ අනුව පෙර සිට බල නොපැවෙත්වෙන පරිදි නැවත A vii වන ශ්‍රේණියට පත් කිරීමකි.)

ආ. එසේ පෙර සිට A vii ශ්‍රේණියට පත් කිරීමේදී තනතුරු නව පිරිස් බල සැකැස්මට අනුව A vii ශ්‍රේණියේ නිලධාරි (අලෙවි) යනුවෙන් සංශෝධනය කිරීම.

ඇ. එසේ නැවත පත් කිරීමේදී අවසන්වරට A vii ශ්‍රේණියේ ඔහු ලද වැටුප් ලක්ෂ්‍යය මත පිහිටුවා කටයුතු කිරීම.

ඈ. නඩුවේ මෙම සමථය ඉල්ලුම්කරුට පමණක් පූර්ණ හා අවසන් සමථයක් බවට පත් විය යුතු බව.

මේ අනුව ඉහත දෙපාර්ශ්වයේ කැමැත්ත පරිදි මෙම නඩුව මෙයින් අවසන් කරමි.

දිනය : 2017.11.13

ආර්. එස්. ආරියපෙරුම,
බේරුම්කරු.

02-69

*මගේ අංකය* : IR/10/09/2013.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.03.23 දිනැති හා අංක 1907/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2015.03.12 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, පීටර්ස් ලේන්, අංක 22 හි පදිංචි ඒ. එල්. එස්. දිසානායක මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, නවම් මාවත, අංක 46/56, ලන්ලිබ් ගොඩනැගිල්ල, 3 වන මහල හි පිහිටි ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.08.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය* : IR/10/09/2013.

කාර්මික අධිකරණයේ දී ය.

ඒ. එල්. එස්. දිසානායක මිය,
අංක 22,
පීටර්ස් ලේන්,
දෙහිවල.

නඩු අංකය : A 3595

*පළමු පාර්ශ්වය*

සහ

ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ්,
(The Sri Lanka - Libya Agricultural and Livestock Development Company Ltd.)

3 වැනි මහල,
ලන්ලිබ් ගොඩනැගිල්ල,
අංක 46/56, නවම් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින ආරාවුල

**ප්‍රදානය**

අධිකරණ සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2015.03.12 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

"ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් (The Sri Lanka - Libya Agricultural and Livestock Development Company Ltd.) හි සේවය කරනු ලැබූ ඒ. එල්. එස්. දිසානායක මහත්මියට වැටුපට අමතරව ලබාදෙන ලද ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකථන බිල්පත්, වෛද්‍ය බිල්පත් ආදිය 2007 ජනවාරි මස සිට 2008 දෙසැම්බර්

මාසය දක්වා ලබා නොදීමත් ඊට අමතරව නිවාස කුලී දීමනාව ( Rent Allowance), සංග්‍රහ දීමනාව ( Entertainment Allowance+), ආදිය 2008 පෙබරවාරි මස සිට 2008 සැප්තැම්බර් මාසය දක්වා ලබා නොදීමත් යුක්ති සහගතද? එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඇයට ලබාදිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**නඩු පටිපාටිය**

බේරුම්කරණ විභාග පටිපාටිය අනුව පළමුවන සහ දෙවන පාර්ශ්වයන්ට තම ස්ථාවරය දැක්වෙන පළමුවැනි ප්‍රකාශය 2015.05.15 වැනි දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් දැනුම් දී ඇත. ඒ සඳහා තවත් කාලය දෙන ලෙස ඉල්ලුම්කාරියගෙන් ඉල්ලීම් ලැබී ඇත. ඒ අනුව ඒ සඳහා ඉඩක් සළසා දෙනු ලැබ 2008.12.03 දතමින් LANLIB හි සභාපති වරයා අමතා යවන ලද ආවරණ ලිපියක් සහිත බිල්පත් ඡායා පිටපත් මිටියක් 2015.06.15 දින ලැබෙන සේ කාර්මික අධිකරණයට එවා ඇත. තමාගේ ඉල්ලීම විස්තර කරමින් ඉදිරිපත් කළ යුතු විස්තර ප්‍රකාශයක් එහි නොවීය. දෙවන පාර්ශ්වය වන වගඋත්තරකාර ආයතනය වෙතින් පළමු ප්‍රකාශය ඉල්ලා යවන ලද ලිපි සියල්ල නොබෙද ආපසු ලැබී ඇත.

මෙම පසුතලය යටතේ තවදුරටත් කල් දීමෙන් පසු ව නඩුව 2015.07.13 දින පැවැත්වීමට පළමු වතාවට කැඳවනු ලැබුණි. වගඋත්තරකාර ආයතනය වෙත යවන ලද කැඳවීම් ලිපිය නොබෙද ආපසු ලැබී ඇත.

පසුව නඩුව 2015.09.03 දින පැවැත්වීමට දෙවැනි වතාවට කැඳවනු ලැබිණි. ඉල්ලුම්කාරිය විදේශගත වී ඇති බව දන්වමින් ඇය වෙනුවෙන් කරුණු දැක්වීමට එච්. ආර්. එල්. ආර්. ද සිල්වා නමැත්තෙකු පැමිණ සිටි අතර ඇය වෙනුවෙන් පෙනී සිටීමට නීතිඥ සුමින්ද පෙරේරා මහතා පැමිණ සිටියේ ය. වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් නියෝජිතයෙකු හෝ නීතිඥ වරයෙකු වත් එදින පෙනී සිටියේ නැත. ආයතනය වෙත යවන ලද කැඳවීම් ලිපිය නොබෙද ආපසු ලැබී ඇත. නීතිඥ පෙරේරා මහතා එදින සැළ කර සිටියේ ආයතනය දී ඇති ලිපිනයේ නොමැති බවත් දැනට එහි කාර්යාලයක් පවත්වාගෙන යන ස්ථානයක් සොයා කාර්මික අධිකරණයට දැනුම් දෙන බවයි.

ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් ආයතනය කලින් ලබා දී ඇති ලිපිනයේ නොපවතින බැවින් එකී ආයතනයේ අනුප්‍රාප්තික ආයතනය ලෙස දක්වමින් ඉල්ලුම්කාරිය විසින් දැනුම් දී තිබුණු ලිපිනයනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලිපි යවා නඩුව 2015.10.13 දින පැවැත්වීමට කැඳවනු ලැබුවත් කිසිවෙකු එදින සහභගි වී නොමැත.

නැවත නඩුව 2016.04.27 දින පැවැත්වීමට කැඳවනු ලැබූ අතර එකී අනුප්‍රාප්තික ආයතනය ලෙස දක්වා ඇති වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් එකී මෝසමක් එවමින් නීතිඥ බී. චන්දන පෙරේරා මහතා බේරුම්කරණ විභාගයට පෙනී සිටීමට වෙනත් දිනයක් ඉල්ලා සිට ඇත.

ඒ අතරතුර එකී නීතිඥ බී. චන්දන පෙරේරා මහතා වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පළමු ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. ඉන් කියැවෙන්නේ අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් ආයතනය රජය මගින් මිලට ගෙන ඇති බවත්, එය පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ සම්පූර්ණයෙන්ම රජය සතු ආයතනයක් ලෙස කටයුතු කරන බවත්, ද ශ්‍රී ලංකා - ලිබියා ඇග්‍රිකල්චරල් ඇන්ඩ් ලයිව්ස්ටොක් ඩිවලොප්මන්ට් කම්පැනි ලිමිටඩ් ආයතනය මේ වන විට සියළු වගකීම් වලට මුදල් ගෙවා අවසාන කර එකී සමාගම ඈවර කර අවසන් කර ඇති බවයි. අවසන් වශයෙන් දක්වා ඇත්තේ ඒ. එල්. එස්. දිසානායක මහත්මිය වෙත කිසියම් මුදල් ප්‍රමාණයක් ගෙවීමේ වගකීමක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට හෝ ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන පුද්ගලික සමාගමට හෝ නැති බවයි.

මෙම පසුතලය යටතේ නඩුව 2016.05.24 දින පැවැත්වීමට කැඳවනු ලැබුණි. ඉල්ලුම්කාරිය ඒ. එල්. එස්. දිසානායක මහත්මිය ද ඇය වෙනුවෙන් කරුණු දැක්වීමට බලය පැවරූ නියෝජිත එච්. ආර්. එල්. ආර්. ද සිල්වා මහතා ද පැමිණ සිටියහ. ඇය වෙනුවෙන් පෙනී සිටීමට එදින නීතිඥවරයෙකු සහභාගි වුනේ නැත. වගඋත්තරකාර පාර්ශ්වය වශයෙන් නම් කෙරුණු අනුප්‍රාප්තික ආයතනය වන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කළමනාකාර සහකාරවරයෙකු වන එම්. යූ. ඒ. මෙන්ඩිස් මහතා සහභාගි වූ අතර ආයතනය වෙනුවෙන් නීතිඥ බී. චන්දන පෙරේරා මහතා පෙනී සිටියේ ය. එදින කිසියම් සමථයක් ඇති කිරීමට උත්සාහයක් ගත්ත ද අවසන් තීරණයක් නොගැණුන අතර දෙවන ප්‍රකාශයන් ඉදිරිපත් කරන ලෙස දෙපාර්ශවයට ම දැනුම් දී බේරුම්කරණ විභාගය 2016.07.05 දින පැවැත්වීමට කල් තැබිණි.

මේ අතරතුර ඉල්ලුම්කාරිය තම ඉල්ලීම ඇතුළත් නඩුව ඉල්ලා අස්කර ගන්නා බව දන්වමින් 2016.06.30 දතම ඇති ව ලිපියක් බේරුම්කරුගේ නමට කාර්මික අධිකරණයට එවා තිබුණි. එම ලිපියේ උධෘතයක් පහත දැක්වේ.

*"I refer to the above & wish to inform you that I have decided to withdraw the case that I have filed against LANLIB requesting my dues.*

*The reason for my decision is due to the fact that my claims were made based on a "Principle" where I was convinced that a grave injustice was done to me by the former Managing Director and few Senior Officers of LANLIB due to a personnel vendetta as explained in detail in my previous communication to your honorable self and not due to a direneed for money. My inention from the very inception was to contribute this money for a charitable purpose & not for my personnel benefit or usage.*

*However, it is apparent to me now that the perpetrators of the injustice done to me are no longer available and the company itself is not in existence and I am pursuing a case against a totally unconnected organization and holding a group of people who has absolutely no knowledge nor involvement of the above mentioned unjust actions which by itself does not serve my original purpose for which the case was filed, as such under the present circumstances it becomes a pointless and futile exercise.*

*I hope your honor would understand and appreciate the reason behind my decision and kindly permit me to withdraw the case against LANLIB."*

එම නිසා ඉහතින් දක්වා ඇති බේරුම්කරණය සඳහා වන යොමු කිරීම සම්බන්ධයෙන් තව දුරටත් කටයුතු කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

**ප්‍රදානය**

අධිකරණ සහ කම්කරු සබඳතා අමාත්‍යතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2015.03.12 දිනැති නියෝගයෙන් මා වෙත යොමුකර ඇති යොමුව සම්බන්ධයෙන් වන කාර්මික ආරවුලට අදාළ ඒ. එල්. එස්. දිසානායක මහත්මියගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි.

**එස්. විරිතමුල්ල,**
බේරුම්කරු.

2017 අගෝස්තු 10 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

02-70

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.